**මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 - 2022**

**-----------------------------------------------------------------------------**

1. **විගණන මතය**

**1.1** මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 ක2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 18 ක මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීමට හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් 1.3 ඡේදය යටතේ දැක්වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන**

**1.3.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වුවද ගොවිජන සේවා කාරක සභා 18 හිම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කරමි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතුය. |
| (ආ) මොණරාගල ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර වත්කම්වල ගත් මිල,සමුච්චිත ක්ෂය හා ශුද්ධ අගය යන වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර, ඒවායේ පිරිවැය,වර්ෂයේ එකතු කිරීම්,බැහැර කිරීම්, වාර්ෂික ක්ෂය සහ සමුච්චිත ක්ෂය සහ ශුද්ධ අගය වෙන් වෙන්ව දැක්වෙන පරිදි උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන නිවැරදිව සකස් කර ඉදිරිපත් කරමි. | නිරීක්ෂණයේ දැක්වෙන විස්තර ඇතුලත් උපලේඛනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතුය. |

**1.3.2** **ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) ගොවිජන සේවා මධ්‍යස්ථාන 15 ක මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතබුණි. | ඉදිරියේ තක්සේරු කර ගිණුම් වාර්තාවල ඇතුලත් කරමි. | කාරක සභා සතු ඉඩම්වල නිවැරදිව අයිතිය තහවුරු කරගෙන වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2016, 2017 හා 2021 වර්ෂ වල ගොවිජන සේවා කාරක සභා 07කට මොණරාගල ගොවිජන සංවර්ධන කොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු උපකරණ ඒකක 33 ක් හා ගොවි සංවිධාන 02 කින් පරිත්‍යාග ලෙස ලැබුණු උපකරණ ඒකක 16 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | එම උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. | කාරක සභාවට ලැබුණු සියලුම වත්කම් වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) අලුත් වැව ගොවිජන සේවා කාරක සභාවේ 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොවිජන බැංකුවෙන් කාරක සභාව වෙත ලැබිය යුතු ලාභාංශ රු.573,910 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණු අතර, ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබියයුතු ලාභාංශ සම්බන්ධයෙන් නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් පවත්වා තිබුණු ස්ථාවර තැන්පතු 12 ක් වෙනුවෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම් රු.597,545 ක් ගිණුම්ගත කර නොතිබීමෙන් එම වටිනාකමින් වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් අඩුවෙන් ගණනය කර තිබීම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ස්ථාවර තැන්පත් පොලියද ඇතුලත් කර නිවැරදිව ගිණුම් පිළියෙල කළයුතුය. |
| (ඉ) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකම මත තොගයේ අගය දැක්විය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 10 ක කිසිදු විකුණුම් වටිනාකමක් නොමැති යල්පැන තිබුණු එකතුව රු.2,876,013 ක් වූ තොග වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉතිරි තොග ලෙස ඇතුලත්ව තිබීමෙන් එම වටිනාකමින් ව්‍යාජ වත්කම් දක්වා තිබුණි. | වටිනාකම පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | යල් පැන තිබුණු තොග සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදුකර ගිණුම් ප්‍රකාශනවල ගැලපීම් කළයුතුය. |
| (ඊ) ගොවිජන සේවා කාරක සභා 02 කට අදාලව ක්ෂය කර පොත් වලින් ඉවත් කර තිබු නමුත් දැනට භාවිතයට ගනු ලබන රු.664,000 ක් ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනයකර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | අදාල වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කලයුතුය. |
| (උ) කතරගම ගොවිජන සේවා කාරක සභාවේ නාගරික සංවර්ධන අධිකාරියෙන් කුලී පදනම මත කඩ කාමර 02 ක් ලබා ගැනීම වෙනුවෙන් එම ආයතනයට ගෙවා තිබුණු රු.702,240 ක මූලික මුදල ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම්ගත කර එම වටිනාකම මත සමාලෝචිත වර්ෂය සඳහා රු.35,112 ක ක්ෂය ප්‍රතිපාදන ඇති කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතු රු.1,300,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද, එය මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් ක්‍රමය අනුගමනය කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (එ) ගොවිජන සේවා කාරක සභා 03 කට අදාලව රු.533,939 ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 43 ක් හාගොවිජන සේවා කාරක සභා 04 කට අදාලව රු. 667,962 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 38 ක් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වලින් කපාහැර තිබුණු අතර, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | කාරක සභා අනුමැතියෙන් කපාහැර ඇති අතර විධිමත් අනුමැතියක් ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. | විධිමත් අනුමැතියක් ලබාගැනීමෙන් පසුව ගිණුම් ශේෂ පොත්වලින් ඉවත් කළයුතුය. |
| (ඒ) ගොවිජන සේවා කාරක සභා 3 කට අදාලව රු.560,440 ක වටිනාකමකින් යුතු ව්‍යාජ වගකීම් ශේෂ 04 ක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ව්‍යාජ වගකීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 08කට අදාලව ගිණුම් ශේෂ 13ක මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු වටිනාකම් හා අනුරූපී වාර්තා අනුව දක්වා තිබුණු වටිනාකම්අතර රු.10,652,869 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබන ශේෂ හා අනුරූපී වාර්තා අනුව ශේෂ නිවැරදිව ගැලපීම් කළයුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙණු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 ජූනි 17 දිනැති අංක 11/2018 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය හා 2018 මැයි 17 දිනැති අංක 7/5/2-1/2 (i) දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව රු.50,000 ක මුදල් සීමාව ඉක්මවා බැංකු ගිණුම් වලින් මුදල් ගැනීම් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව සිදුකළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 2 ක අවස්ථා 6 ක දි රු.19,484,328 ක් ගෙවීම් කිරීමේදී එසේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතුය. |

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 2 කට අදාලව වර්ෂ 17 කට පෙර සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය රු.203,469 ක් නිරවුල් කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. | අවිනිශ්චිත ගිණුම්වල පවත්නා ශේෂය නිවැරදි කළයුතුය. |

### 1.3.6 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 ක රු.55,290,329 ක වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් එකතුව ශේෂ 93 කට අදාලව ඒවා සනාථකර ගැනිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි | ඉදිරියේදී ශේෂ සනාථයන් ලබාගැනීමට කටයුතු කරමි. | ගිණුම් ශේෂ තහවුරු කරගැනීමට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ53(4) වගන්තිය | ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉඩම් හිමි නාම ලේඛනය සෑම අවුරුදු 03 කට වරක් ප්‍රතිශෝධනය කර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කළ යුතු වුවත්, මැදගම ගොවිජන සේවා කාරක සභාවේ 2016 න් පසුද, බිබිල ගොවිජන සේවා කාරක සභාවේ 2019 න් පසුද, එය ප්‍රතිශෝධනය කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රතිශෝධන කිරීමට කටයුතු කරමි | ඉඩම් හිමි නාම ලේඛන කඩිනමින් ප්‍රතිශෝධනය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 316 | මුදල් හා මූල්‍ය වටිනාකම් ඇති ලේඛන තබා ගැනීම සඳහා ආරක්ෂිත සේප්පුවක් භාවිතා කළ යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා තුනක් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | සේප්පු ලබා ගැනීමට කටයුතු කරමි. | මුදල් හා මූල්‍ය නොවන ලේඛනවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත සේප්පුවක් භාවිතා කළයුතුය. |
| **(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ** | | | |
| 8.9 (ආ) වගන්තිය | රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම් සඳහා විධිමත් ගිවිසුම් අත්සන් කර මිලදී ගැනීම් සිදුකලයුතු වුවත්,මොණරාගල දිස්ත්‍රික් සහාකාර කොමසාරිස් කාර්යාලය විසින් ගොවි බැංකුවල භාවිතය සඳහා රු. 3,846,600 ක පරිගණක යන්ත්‍ර 14ක් මිලදීගැනීමේදී එම නියමයන්ට අනුකූලව සැපයුම්කාර ආයතනය සමඟ ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

**(ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 30 (1) ඡේදය | කාරක සභාව සතු තොග, මුදල්,බඩු බාහිරාදිය සහ වෙනත් සියළුම ස්පෘශ්‍ය වත්කම් ලේකම්වරයා විසින් මුදල් වර්ෂය අවසානයේදී අඩු වශයෙන් කාරක සභාවේ එක් සමාජිකයෙකු ඇතුළත්ව පරීක්ෂා කර බලා සහතික කර අත්සන් තබා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළයුතුය. |
| (ii) | 30(2) ඡේදය | වත්කම් හා ණය තුරුස් සනාථ කිරිම සඳහා ණයකරුවන්ගෙන් හා ණයහිමියන්ගෙන් තහවුරු කිරීමේ සහතික ලබාගත යුතු වුවත්, කතරගම හා මැදගම ගොවිජන සේවා කාරක සභාවල රු.306,315 ක් වූ ණයගැතියන් 32කුගෙන්ද, රු.32,489,140 වූ ණයහිමියන් 32කුගෙන්ද, තහවුරුකිරීම් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළයුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,530,611කඅතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,825,337ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,705,274ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයටප්‍රධාන වශයන් ගොවිජන සේවා කාරක සභා වල පසුගිය වර්ෂවලට වඩා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩිවීම හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 06 කට අදාලව වසර 08 සිට වසර 16 ක් දක්වා වූ රු. 7,097,850ක්වූ තොග , මුදල් ඌණතා හා පාඩු 08 ක් සම්බන්ධයෙන් විගණන දිනය වූ 2023 මැයි 23 දින වන විටත් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන මුදල් රෙගුලාසි 156 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව ඌණතා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූලික විමර්ශන ආරම්භ කරඇත. මුදල් අය කර ගැනීම සඳහා ලිපි යොමු කර ඇත. වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන ඌනතාවය අය කර ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර මුදල් ඌණතා හා පාඩු පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ පුරන් කුඹුරු හා සුළු වාරිමාර්ග අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය යටතේ මැදගම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයට අයත් අමුණු 02 ක් ප්‍රතිසංස්කරණය කිරීමට රු.3,417,687ක් වැයකර තිබුණද, ඉදිකර තිබූ අමුණු හා ඇල මාර්ග භාවිතයට නොගෙන නිසි නඩත්තු කිරීමකින් තොරව වල් බිහිවී තිබූ අතර ඒවා අඛණ්ඩව නඩත්තු කර ප්‍රයෝජනවත් ආකාරයෙන් භාවිතයට ගැනීමට කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | වැයකළ මුදලට සරිලන ආර්ථික වටිනාකමක් ලබා දීමට පියවර ගත යුතුය. |
| (ආ) කතරගම ගොවිජන සේවා කාරක සභාව විසින් පසුගිය වර්ෂයේදී කමිටු අරමුදලින් රු.879,008 ක් වැයකර කමිටු ගොඩනැගිල්ල අලුත්වැඩියා කර තිබුණු අතර, පසුව සම්පූර්ණ ගොඩනැගිල්ලම කඩා ඉවත් කර සමාලෝචිත වර්ෂය අවසානය වන විට නව කමිටු ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුණි. විධිමත් සැලසුමකින් තොරව අලුත්වැඩියා කටයුතු කිරීම නිසා ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා පසුගිය වර්ෂයේ වැයකර තිබුණු රු.879,008 ක මුදල නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය. | පිළිගනිමි. ඉදිරියේදී මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලැබේද යන්න පරීක්ෂා කර කමිටු අරමුදල් මඟින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. | විධිමත් සැලසුමකින් තොරව ක්‍රියා කිරීම නිසා සිදු වූ නිශ්කාර්ය වියදම් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළයුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1993 සිට 2021 දක්වා මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පවතින ගොවිජන සේවා කාරක සභා 13 කට අදාල රු. 7,884,878 ක් වටිනා ලැබිය යුතු ගිණුම් ශේෂ 325 ක් අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදී ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කරමි. | ලැබිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 1989 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පවතින ගොවිජන සේවා කාරක සභා 15 කට අදාල රු.13,238,595 ක් වටිනා ගෙවිය යුතු ගිණුම් ශේෂ 41 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ගොවිජන සේවා කාරක සභා 03 ක 1989 සිට 2010 දක්වා නිලධාරීන් 11 දෙනකුගෙන් අයවිය යුතු රු. 579,546 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් 1999 සිට 2020 දක්වා ප්‍රතිලාභීන් 08 දෙනකුගෙන් අයකර ගෙන තිබුණු රු. 2,147,060 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් දිස්ත්‍රික් කාර්යාලය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව නිරවුල් කිරීමට කටයුතු කරමි. | ප්‍රේෂණය කළයුතු වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 හා 2012 පෙබරවාරි 29 දිනැති ගොවිජන බැංකු චක්‍රලේඛයේ 2.6.2 වගන්තිය ප්‍රකාරව වසම්භාර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකල යුතුව තිබුණද, එම කාර්යයන් ඉටුකර නොතිබුණි.<br>(i) ණය සම්බන්ධයෙන් මනා විනයක් පවත්වා ගැනීම.<br>(ii) ගොවි සංවිධාන තුල ස්ථාපිත ණය අනු කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම හා එහි කාර්යය භාරයට වගකීම.<br>(iii) වසමේ ගොවීන් හා ගොවි බැංකුවලට අදාල දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගෙන යාම.<br>(iv) වසමේ ගොවීන්ගේ ණය අවශ්‍යතා හඳුනාගැනීම, ඒවා සම්පූර්ණ කිරීමට උපදෙස් සැපයීම, මඟ පෙන්වීම හා නිසිකලට ණය අයකර ගැනීම<br>(v) වසමේ ගොවීන් වෙත නිකුත් කර ඇති ණය කලට වේලාවට අයකර ගැනීම. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 දරණ 2012 පෙබරවාරි 29 දිනැති ගොවි බැංකු චක්‍රලේඛයේ 2.6.2 වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් කටයුතු කළ යුතුය. |
| (ඊ) වසම් භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ කාර්යය සාධනය ඇගයීම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදය ප්‍රකාරව කලයුතු අතර, නිලධාරියාගේ කාර්යය සාධනය මත ඔවුන් විසින් වාර්ෂික වැටුප් වර්ධකයන් උපයාගත යුතුය. එසේ වුවත් වසම්භාර නිලධාරීන් විසින් තම නිශ්චිත කාර්යය භාර්යන් ඉටුකර නොතිබියදී, කාර්යය සාධනයන් ඇගයීමෙන් තොරව වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම් සිදුකර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ක්‍රියාකිරීමට කටයුතු කරමි. | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදක සහකාර නිලධාරීන්ගේ කාර්ය සාධනය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් පස් පරීක්ෂණ ඒකකයට 2019 වර්ෂයේදී වර්ග මීටර් 50 ක ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් හා 2017 නොවැම්බර් 28 දින අදාල ඒකකයට ලබාගෙන තිබුණුපරීක්ෂණ උපකරණ අයිතම 98 ක් විගණන දිනය වූ 2023 ජුනි 15 දින වන විටත්, එම භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණි. | ඉදිරි වර්ෂයේදී අරමුණුගතව ක්‍රියා කිරීමට කටයුතු කරමි. | අදාල ගොඩනැගිල්ල හා පරීක්ෂණ උපකරණ භාවිතයට ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කතරගම සංචාරක බංගලාවක් ඉදිකර 2021 ඔක්තෝම්බර් 08 දින වැඩ නිමකර තිබුණද, 2023 ජුනි 15 දින වන විටත් එම ගොඩනැගිල්ල අරමුණු ගත කාර්යය සඳහා යොදා නොගෙන තිබියදී ඒ සඳහා අනුයුක්ත කර තිබූ සංචාරක බංගලා භාරකරුට 2022 ඔක්තෝම්බර් 10 දින සිට 2023 ජුනි මාසය දක්වා වැටුප් වශයෙන් රු.413,356 ක් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත අවශ්‍ය උපකරණ ලබාගැනීමෙන් පසු ආරම්භ කිරීමට කටයුතු කරමි. | සංචාරක බංගලාව අරමුණු ගත කාර්යයන් සඳහා කඩිනමින් උපයෝජනය කරගත යුතුය. |
| (ඇ) දිස්ත්‍රික් කාර්යාලය සතුව පවතින ධාවන තත්වයේ නොපවතින අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන 03 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙනු ලබන උපදෙස් මත ක්‍රියාකිරීමට කටයුතු කරමි. | වාහන සම්බන්ධයෙන් විධිමත් හා සුදුසුකම් ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්කර සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතුය. |
| (ඈ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2016 ජුනි 11 දිනැති අංක 10/2015 දරණ චක්‍රලේඛය අනුව ගොවිජන සංවර්ධන සභාව සතු කෘෂි යන්ත්‍ර උපකරණ නිශ්කාර්යව නොතිබිය යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 10 කට අදාලව වටිනාකම රු.6,650,049 ක් වූ උපකරණ 11 ක් ද, වටිනාකම දක්වා නොතිබුණු උපකරණ 36 ක් ද නිශ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේදී ඵලදායී ලෙස භාවිතා කිරීමට හෝ දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන උපදෙස් අනුව වෙනත් මධ්‍යස්ථාන වෙත ලබාදීමට කටයුතු කරමි. | නිශ්ක්‍රීය වත්කම් කඩිනමින් උපයෝජනය කර ගැනීමට ක්‍රියාකල යුතුය. |
| (ඉ) ගොවිජන සේවා කාරක සභා 06 කට අදාල ඉඩම්, නිල නිවාස 02 ක්, අලෙවි සැල් 03 ක් හා කඩ කාමර 05 ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ඉදිරි වර්ෂය තුලදී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | නිශ්ක්‍රීය වත්කම් කඩිනමින් උපයෝජනය කර ගැනීමට ක්‍රියාකල යුතුය. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තණමල්විල හෙල බොජුන්හල ඉදිකිරීමේ කර්මාන්තය 2021 ජුලි 12 දින රු.5,357,585 ක වටිනාකමකට පුද්ගලික ආයතනයක් වෙත පවරා තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ලේ අත්තිවාරම බැදීම, කුළුණු බැදීම හා වැසිකිලි පද්ධතිය ඉදිකිරීමෙන් පසු 2022 මාර්තු කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබුණි. 2023 ජූනි 07 දින වන විටත් අදාල ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වගකිව යුතු ආයතන විසින් කටයුතු කර නොතිබුණු අතර ඉදිකර තිබූ ගොඩනැගිලි පරිශ්‍රය වල් බිහි වී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වැයකළ මුදල සරිලන ආර්ථික වටිනාකමක් ලබා දීමට පියවර ගත යුතුය. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ මැදගම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර ගබඩාව ඉදිකිරීම සම්බන්ධයෙන්2023 ජූලි 05 දින සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) ඇස්තමේන්තු විෂය අංක C -10 යටතේ ඉදිරිපස මිදුල කොන්ක්‍රීට් කිරීමේදී ඝන මීටර් 30.7 ක් සඳහා රු.545,969 ක් ගෙවා තිබුණද, භෞතිකව පරීක්ෂා කිරීමේදී ඝන මීටර් 22.29 පමණක් කොන්ක්‍රීට් යොදා තිබුණි. ඒ අනුව කොන්ක්‍රීට් ඝන මීටර් 8.41ක් යොදා නොතිබුණ අතර ඒ වෙනුවෙන් රු.149,563 ක් වැඩිපුර ගෙවා තිබූ අතර, යොදා තිබුණු කොන්ක්‍රීට් නිසි ප්‍රමිතියෙන් නොතිබුණු බවද නිරීක්ෂණය විය. | වැඩිපුර ගෙවීම් තැන්පතු මුදල් වලින් අයකිරීමට කටයුතු කරමි. | කළවැඩ සඳහා පමණක් ගෙවීම් කළයුතු අතර වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු අයකර ගත යුතුය. තවද නියමිත ප්‍රමිතියෙන් යුතු කොන්ක්‍රීට් මිශ්‍රණය යොදාගත යුතුය. |
| (ආ) ගබඩාවේ පිටුපස දොර ඉදිකිරීම සඳහා විෂය අංක 7.1 යටතේ රු. 61,502 ක් ගෙවීම් කර තිබුණද දොර ලෑලි අතර හිඩැස් පැවතීම හා උළුවස්ස හා දොර නිසි ආකාරව සම්බන්ධ වී නොතිබීම හේතුවෙන් ප්‍රමිතියෙන් තොරව එම කාර්යය සිදුකර පැවති බව නිරීක්ෂණය විය. | තැන්පතු වලින් නැවත අළුත්වැඩියා කිරීමට කටයුතු කරමි. | ඒ ඒ වැඩ විෂයයන් නියමිත ප්‍රමිතියෙන් යුක්තව සිදුකළයුතු අතර දෝෂ සිදුවී ඇත්නම් ඒවා යථා තත්ත්වයට පත්කර ගැනීමෙන් පසු ගෙවීම් කළයුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් කාර්යාලයට සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත 2022 වර්ෂයේදී සිට සංවර්ධන නිලධාරීන් 139 දෙනෙකු අනුයුක්ත කර සේවයේ යෙදී සිටියද, ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම කාර්යයන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | සේවයේ යෙදී සිටින සංවර්ධන නිලධාරීන්ව විධිමත් පරිදි රාජකාරි පැවරීමක් කර අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් කර ගත යුතුය. |

### 3.8 වාහන පද්ධති කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණන දිනය වූ 2023 ජූනි 09 දින සිදුකල භෞතික විගණන පරික්ෂාවේදී ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය සතු කැබ් රථයක මයිලෝමීටරය අනුව ධාවන කර තිබූ කිලෝමීටර සංඛ්‍යාව 128,193 ක් වූ අතර එය රථයේ දෛනික ධාවන සටහන අනුව කිලෝමීටර සංඛ්‍යාව 126,809 ක් වුයෙන් කිලෝමීටර 1,384 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉහත කැබ් රථයේ ඉන්ධන තුලන රේටය අනුව ඉන්ධන ලීටර 173 ක් යොදා ගනිමින් කිලෝමීටර 1,384 ක දුරක් විධිමත් අනුමැතියකින් තොරව ධාවනය කර තිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග මත විනය පරීක්ෂණ මඟින් විනයානුකූලව කටයුතු කරන අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | අනුමැතියකින් තොරව ධාවනය කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු පරිදි ක්‍රියාකළ යුතුය. |

### 4. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගොවිජන සේවා කාරක සභා 18 ක 1999/2000 මහ කන්නයේ සිට 2022 යල කන්නය දක්වා ගොවීන් වෙත ලබාදී තිබුණු වගා ණය සහ පොලී වශයෙන් අයවිය යුතු රු.134,187,719 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තෙළුල්ල ගොවිජන බැංකුවේ ඉතිරිකිරීම් ගිණුම් වර්ග 06 ක පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඉතිරිකිරීමේ ප්‍රතිශතයන් සියයට 44 සිට සියයට 83 දක්වා පහත වැටී තිබුණු අතර කාන්තා ගොවි සංවිධාන ඉතුරුම් ගිණුම් වල සමාලෝචිත වර්ෂයේ කිසිදු මුදලක් තැන්පත් කර නොතිබුණි. | ගොවි සංවිධාන 20 ක් අක්‍රියව පවතින අතර කාන්තා ගොවි සංවිධාන 32 ක් කුඩා කණ්ඩායම් පිහිටුවා ගෙන ඇති අතර සියයට 01 පොලීය මත ණය ගනුදෙණු ක්‍රියාවලියක් ඔවුන් ආරම්භ කර ඇත. | ගොවිජන බැංකුවේ කාර්යසාධනය ඉහල නංවා ගැනීමට ක්‍රියාකළ යුතුය. |